# තනතුරු - ඇබෑර්තු

**<u>උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව</u>**

**<u>උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා බඳවා ගැනීම</u>**

උතුරු මැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ පුරප්පාඩුව පවතින පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පත්කිරීමට, උතුරු මැද පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය සහ ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය පරිදි දැනට රාජ්‍ය සේවයෙහි හා පළාත් රාජ්‍ය සේවයෙහි නියුතු ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ නිලධාරීන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

*01. සුදුසුකම්:*

I. ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ 1 ශ්‍රේණියේ වසර 05කට නොඅඩු සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් තිබිය යුතුය.
II. 2023.01.01 දිනට වයස අවුරුදු 58ට නොවැඩි විය යුතුයි.
III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන විට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු යි. වාර්ෂික වැටුප් වර්ධක සියල්ල උපයාගෙන සතුටුදායක හෝ ඉන් ඉහළ කාර්යසාධන මට්ටමක් අත්කරගෙන තිබිය යුතුය.
IV. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට පූර්වාසන්න පස් වසරක කාල සීමාවක් තුළ විනය කටයුත්තකට හෝ විනය දඬුවමකට භාජනය නොවූ අයෙකු විය යුතු ය.

*02. තෝරා ගැනීමේ ක්‍රමය:*

උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය සහිතව උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නම් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී, ලබා ගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවෙල මත තෝරා ගැනීම සිදු කරනු ලැබේ.

***සටහන:*** සුදුසුකම් සනාථ කෙරෙන සියලුම සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් , ජාතික හැඳුනුම්පතේ හා උප්පැන්න සහතිකයේ සහතික කරන ලද ඡායා පිටපත් අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය.

*03. අයදුම්පත් ඉදිරිපත් කිරීම:*

සියලුම අයදුම්පත් විධිමත්ව හා නිවැරදිව සම්පූර්ණ කර 2022.12.23 වැනි දින හෝ ඊට පෙර ලැබෙන ලෙස දෙපාර්තමේන්තු ප්‍රධානියා සහ අදාළ අමාත්‍යාංශ ලේකම් මඟින් (පළාත් සභාවට අන්තර්ග්‍රහණය වූ නිලධරයෙකු නම් ඔබගේ අයදුම්පත පළාත් අමාත්‍යාංශ ලේකම් හා ප්‍රධාන ලේකම් ගේ නිර්දේශ සහිතව යොමු කළ යුතුය.)"ලේකම්, උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර" යන ලිපිනයට ලැබෙන සේ

ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරේ "උතුරු මැද පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම්පත් කැඳවීම" යනුවෙන් සඳහන් කළ යුතුය. නියමිත දිනට පසු ලැබෙන අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් ප්‍රමාද වීම හෝ නැතිවීම පිළිබඳ කිසිදු පැමිණිල්ලක් උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් භාර ගනු නොලැබේ.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් මෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ තිරණ ගැනිමේ බලය උතුරු මැද පළාත් ගරු ආණ්ඩුකාරවරයා සතුවේ.

මෙයට,

උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා ගරු ආණ්ඩුකාරතුමාගේ නියමය පරිදි,

ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
උතුරු මැද පළාත.

2022.12.09.